38 - III 14

මැතිවරණ කොමසාරිස් කාර්යාලය
27 JAN 2012
රාජගිරිය

# එක්සත් ලංකා මහා සභා පක්ෂය

## (මැතිවරණ සංවිධාන)

## ව්‍යවස්ථාව

(2011 අගෝස්තු මස 18 වන දින පැවැති 06 වන ජාතික මහා සම්මේලනයේදී සංශෝධන සහිතව සම්මත කරගන්නා ලද නව ව්‍යවස්ථාව)

( 2011 අගෝස්තු මස 18 වන දින සිට පැරණි ව්‍යවස්ථාව මුළුමනින්ම අහෝසි වේ)

මෙතෙක් එක්සත් ලංකා මහා සභාව යනුවෙන් හැඳුන්වූ මෙම පක්ෂය

මින් මතුවට එක්සත් ලංකා මහා සභා පක්ෂය යනුවෙන් හැඳින්වේ

ආචාර්ය නාත් අමරකෝන්
මහ ලේකම්

එක්සත් ලංකා මහා සභාව

Amarakone

13
a-b

# එක්සත් ලංකා මහා සභා පක්ෂය

## දේශපාලන අංශය

## ව්‍යවස්ථාව

මැතිවරණ කොමසාරිස් කාර්යාලය
27 JAN 2012
රාජගිරිය

**1) හැඳින්වීම.**

මෙය සමස්ථ ශ්‍රී ලංකා ජනතාවගේ ඒකාබද්ධභාව සහ සාමූහික සමෘද්ධිය සඳහා විද්‍යාත්මක තර්කානුකූලව සංවාදයක් ඉදිරිපත් කිරීම හා ඒ අනුව ජනතාව මෙහෙයවීම සඳහා කැපවූ දේශපාලන පක්ෂයේ ව්‍යවස්ථාවයි.

මේ සඳහා නූතන දැනුම උපක්‍රම හා නවීන විධි උපයෝගී කර ගැනීම පිණිස සමස්ථ බුද්ධිමත් ජනතාව ඒකරාශී කොටගෙන ජාති වර්ග, කුල ආගම් සහ කොටස් වලින් තොරව රටේ සකල ජනතාවටම නායකත්වයක් ලබාදීම යෝජනා කෙරේ.

පසුගිය ශතවර්ෂ පහකට අධික කාලයක් තුල මානව විද්‍යාව හා තාක්ෂණය වර්ධනය කරගනිමින් ආර්ථික හා සමාජ සංවර්ධනයට තර්කානුකූල බුද්ධිය යොදාගෙන ඇත. එයින් ඈතට සිට අපගේ ජනතාව දියුණු වූ ජාතීන් විසින් යටත් කරගෙන සිටි බව වටහාගෙන ලෝක න්‍යාය තුල අපරටට නිදහස ලබාගෙන ඇත. එයින් පසුද යථාර්ථය හඳුනාගැනීමට නොහැකිව සිටින අපේ ජනතාව ඉදිරියට යෑමට නම් නූතන ලෝකයේ දියුණුවට හේතුවන සකල විධි බුද්ධි මහිමය හඳුනා දැඩි උත්සාහයක් ගෙන කටයුතු කළ යුතුමය. මේ සඳහා සකල ජනතාව ඒකරාශීව කටයුතු කළ යුතුය. ජාති කුල ආගම් යන කොටස් වලින් තොරව කටයුතු කළ යුතුය. රජයේ සියලු මහජන නියෝජිත ආයතනවල මැතිවරණවලට අපේක්ෂකයින් පත්කරවා ගත යුතුයි

සකල ජනයාට සමාන අයිතිවාසිකම් හිමි බවද ඒ සඳහා සෑම දෙනෙකුම වෙහෙස මහන්සියෙන් බුද්ධිමත්ව කටයුතු කළ යුතු බවද වටහා ගත යුතුය. මෙය ජනතා නිදහසයි. මේ සඳහා රජය විධිමත් වැඩපිළිවෙලක් සැකසිය යුතුය. මිට එරෙහිව දැනටමත්, ඉදිරියේදීත්, ඇතිවන දෙස් විදෙස් කුමන්ත්‍රණකාරී පිළිවෙත් පරාජය කළ යුතුය.

**2) ලිපිනය** :- එක්සත් ලංකා මහ සභා පක්ෂය,
107, පියදාස සිරිසේන මාවත,
කොළඹ 10.
0712-521475 / 0718-011664 / 011-2254948

**3) සංඥා** :- 1 නාමය - එක්සත් ලංකා මහා සභා පක්ෂය.

2 ධජය - පළල මෙන් දෙගුණයක් දිග රන්වන් කහ පාට කොඩියක උල්පත් පැන ලකුණ.

3 මැතිවරණ සලකුණ :- උල්පත් පැන.

එක්සත් ලංකා මහා සභාව
107, පියදාස සිරිසේන මාවත,
කොළඹ - 10.

ආචාර්ය නාත් අමරකෝන්
මහ ලේකම්

13 a

**සාමාජිකත්වය**

මෙය කොටස් දෙකකි සමාන්‍ය සමාජික හා අනුබද්ධ සංවිධාන සමාජික

- ශ්‍රී ලංකාවේ නිත්‍ය පදිංචි ඇති හෝ විදේශගතව සිටින ශ්‍රී ලංකාවේ පුරවැසිකම අත්නොහල වයස 18 පිරුනු අපගේ පක්ෂයේ ව්‍යවස්ථාව පිළිගන්නා හා ඒ මත ක්‍රියා කිරීමට එකඟ වන හා ඒවායේ තීරණ හා ක්‍රියාවට නැංවීමට සූදානම් හා පක්ෂයේ තීරණ හා විධානයන් ක්‍රියාවට නැංවීමට සූදානම් අය පක්ෂ සාමාජිකත්වය ලැබීමට සුදුසු වෙති.
- සෑම වසරක්ම පාසාම සාමාජිකත්වය වසරකින් අලුත් කර ගත යුතුය.
- සාමාජිකයෙකු ලෙස බඳවා ගැනීමේදී ගෙවිය යුතු වාර්ෂික සාමාජික ගාස්තුව රු.120කි. එහෙත් මෙම ගාස්තුව කාලානුරූපව සංශෝධනය කිරීමට කෘත්‍යාධිකාර මණ්ඩලයට බලතල ඇත.
- කෘත්‍යාධිකාරී මණ්ඩලයට තෝරා ගනු ලබන්නේ අවම වශයෙන් වසර 3ක කාලයක් තුල ක්‍රියාත්මක වූ සාමාජිකයන් පමණි.
- පක්ෂයෙන් නෙරපනු ලැබූ සාමාජිකයන් හෝ කලින් පක්ෂය හැර ගිය සාමාජිකයන් යලි පක්ෂයට බඳවා ගත හැක්කේ කෘත්‍යධිකාරී මණ්ඩලයෙන් පමණි.
- පක්ෂ සාමාජිකත්වය මත ඕනෑම කෙනෙකු පිළිබඳව ප්‍රශ්නයක් මතුවී ඇති විට සාමාජිකත්වය දීම ප්‍රතික්ෂේප කිරීමට කෘත්‍යධිකාරී මණ්ඩලයට බලය ඇත.
- පක්ෂ සාමාජිකත්වය ඉල්ලා අස්වීම, පක්ෂයෙන් නෙරපීම, විනය පරීක්ෂණ, අවසාන තීරණය කෘත්‍යධිකාරී මණ්ඩලයේ තීරණ වේ.

**අනුබද්ධ සංවිධාන සාමාජික**

කෘත්‍යාධිකාරී මණ්ඩලය පිළිගන්නා ඕනෑම සංවිධානයක සාමාජිකයෙක් අනුබද්ධ සංවිධාන සාමාජිකයෙක් වේ. ඒ බව තහවුරු කිරීම පිණිස අදාල පිළිගත් සංවිධානයේ සාමාජික පනත් ඉදිරිපත් කල යුතුයි.

**සාමාජිකයන්ගේ වගකීම**

1. පක්ෂයේ සංවිධාන කටයුතු වලට ක්‍රමවත්ව සහභාගි වීම සහ පක්ෂ තීරණයන් හා විධානයන් ක්‍රියාවට නැගීම.
2. පක්ෂයට සෑම විටම විවෘත, අවංක හා සත්‍යවාදි විනය ගරුක වීම හා පක්ෂයේ විශ්වාසය කඩ නොකිරීම.
3. පක්ෂයේ අරමුණ හා ඉලක්ක ජයග්‍රහණය කරවීම සඳහා පෞද්ගලිකවත්, සාමූහිකවත් කැපවීමෙන් කටයුතු කිරීම.

**(1) පක්ෂ ව්‍යුහය**

- පක්ෂ ව්‍යුහය පදනම් වී ඇත්තේ, එය අභ්‍යන්තර වැඩකටයුතු මෙහෙයවනු ලබන්නේත්, කෘත්‍යධිකාරී මණ්ඩලය මඟිනි.
- පක්ෂයේ සියලු වගකීම් හා තනතුරු සඳහා පුද්ගලයන් කෘත්‍යධිකාරී මණ්ඩලය විසින් තෝරා පත්කරගනු ලැබේ.
- කෘත්‍යාධිකාරී මංඩලයේ සියලුම පුරප්පාඩු සම්මේලනය මඟින් තෝරාපත් කර ගත යුතුය.

එක්සත් ලංකා මහා සභාව
107, සිංහල ... මාවත,
කොළඹ - 10.

ආචාර්ය කාන්ත් අමරකෝන්
මහ ලේකම්

- ❖ නිල වශයෙන් ප්‍රකාශන නිකුත් කිරීම ලේකම්ගේ වගකීමයි. මෙකී රැස්වීම් වල ගණපූර්ණය පස් දෙනෙකු වනු ඇත.
- ❖ කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් සෑම දිස්ත්‍රික්කයක් සඳහාම සංවිධායකයෙකු බැගින් පත් කල යුතුය.
- ❖ පක්ෂයේ නායකයා කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් තෝරා ගත යුතුය.
- ❖ සියලුම නිලධාරීන් පත් කිරීමේ බලය කෘත්‍යාධිකාරී මණ්ඩලයට ඇති අතර පක්ෂයේ මහා සම්මේලනයට දැන්විය යුතුය.
- ❖ පක්ෂයේ අරමුදලක් වාණිජ බැංකුවක පවත්වාගෙන යායුතුයි. සියලුම වගකීම් භාණ්ඩාගාරික සතුය. මුදල් බැර කිරීමේදී ලේකම්, සභාපති, භාණ්ඩාගාරික අත්සන් කල යුතුව ඇත.

- ❖ මෙහි ඇතිවන පුරප්පාඩු පිරවීම කෘත්‍යධිකාරී මණ්ඩලය විසින් රැස්වීම්කදී සිදුකල හැක.

<u>ව්‍යවස්ථාව වෙනස් කිරීම</u>

කෘත්‍යාධිකාරී මණ්ඩලයේ අනුමැතියකින් අනතුරුව විශේෂ නියෝජිත සම්මේලනයකදී ඉදිරිපත් වන ව්‍යවස්ථා සංශෝධන රැස්වී සිටින අයගේ වැඩි ඡන්දයෙන් අනුමත කල යුතුය.

(2) විවේචන හා ස්වයං විවේචන පවත්වන අතර පක්ෂය තුල විවෘත සාකච්චා පවත්වනු ලැබේ.

<u>මධ්‍යම සංවිධාන</u>

1. පක්ෂයේ උත්තරීතර ආයතනය මහ සම්මේලනයයි.
2. වසරකට වරක් පක්ෂ සමුළුවක් පවත්වනු ලැබේ.
3. විශේෂ සමුළු වාර පැවැත්වීම, කෘත්‍යාධිකාරී මණ්ඩලය විසින් අවශ්‍ය යැයි අදහස් කල විට ඉල්ලා සිටන විට කරනු ලැබේ.

<u>කෘත්‍යෘධිකාරී මණ්ඩලයට අයත් වන්නේ පහත සඳහන් නිලධාරී,</u>

- ලේකම්
- සභාපති
- උප ලේකම්
- උප සභාපති
- භාණ්ඩාගාරික
- ප්‍රධාන සංවිධායක
- සභිකයන් 7 යි

අවශ්‍යතාවය අනුව අනුශාසකවරු පත්කරගත හැක.

107, [illegible] - 10.

ආචාර්ය නාත් අමරකෝන්
මහ ලේකම්

## පක්ෂ විනය

1. පක්ෂයේ සමගිය රැකගැනීමටත්, ශක්තිමත් කිරීමටත්, පක්ෂයේ ශක්තිය වැඩිදියුණු කිරීමටත් එහි ජයග්‍රහනයේ හැකියාව හා ගරුත්වය ආරක්ෂා කිරීමටත්, නායකත්වය ආරක්ෂා කිරීමටත් විවේචනය නොකිරීමටත්, පක්ෂයේ ක්‍රියාකාරීත්වය භංග නොකිරීමටත් සෑම සාමාජිකයෙකුම කෙරෙහි පක්ෂ විනය පදනම් වේ.

2. පක්ෂය තුල විනයානුකුල දඬුවම් මෙසේය.

   - පක්ෂයේ දරන වගකීම් වලින් ඉවත් කිරීම.
   - පක්ෂයෙන් නෙරපීම.

3. දිස්ත්‍රික් මණ්ඩල පිහිටුවීමත්, පවත්වාගෙන යාමත්, ප්‍රධාන සංවිධායකගේ වගකීමකි

4. දිස්ත්‍රික් මණ්ඩල පිහිටුවීමත්, පවත්වාගෙන යාමත්, පුරප්පාඩු පිරවීමටත්, ප්‍රතිසංවිධාන කිරීමත්, අවශ්‍ය යැයි හැඟෙන විටෙක විසුරුවා හැරීමටත්, කත්‍යෘධිකාරී මණ්ඩලයේ නියෝග සහ මඟ පෙන්වීම යටතේ සිදුකරනු ඇත.

4. සෑම දිස්ත්‍රික් බලමණ්ඩලයක්ම වර්ෂයකට වතාවක් තම මහ සභා රැස්වීම් පවත්වා එහි නිලධාරී මණ්ඩලය සහ කාරක සභාව ප්‍රතිසංවිධානයක් කල යුතුයි. නව ලේකම්වරයා විසින් සියලූම වර්තා, ලේඛන පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා හරහා කත්‍යෘධිකාරී මණ්ඩලයට දැන්විය යුතුයි.

5. සියලූම මැතිවරණ සඳහා තරග කිරීම සඳහා ආසන සංවිධායකවරු විසින් අවශ්‍ය අපේක්ෂකයන් දිස්ත්‍රික් මට්ටමින් සංවිධානය කල යුතු ඇත. එම කත්‍යෘධිකාරී මණ්ඩලයට දැන්විය යුතුයි.

ආචාර්ය නාත් අමරකෝන්
මහ ලේකම්
එක්සත් ලංකා මහා සභා පක්ෂය

ආචාර්ය නාත් අමරකෝන්
මහ ලේකම්

ෆෆෆෆෆෆෆ